නිපුණතාව 16 - ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මානව සම්පත සඵලදායකව සහ කාර්යක්ෂමව යොදා ගන්නා අයුරු විමසයි.

නිපුණතා මට්ටම 16.2 - රැකියා නිර්මාණය කිරීමේ හා රැකියා විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාව අගයයි.

## 1.රැකියා නිර්මාණය (Job Design)

කිසියම් නිශ්චිත පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා රැකියාවක් තැනීම හෙවත් ජනිත කිරීම මෙහි සරල අදහසයි.එනම් යම් නිශ්චිත අරමුණක් ඉටු කිරීම පිණිස සංවිධාන වැඩ ඒකකයක් වශයෙන් කටයුතු,රාජකාරි සහ වගකීම් සකස් කිරීමයි.

සෑම රැකියාවක්ම කටයුතු(Tasks),රාජකාරි(Duties) සහ වගකීම් (Responsibilities) යන මූලිකාංග තුනෙන් සමන්විතය.

කටයුත්තක් යනු චලනවලින් සමන්විත නිශ්චිතව හඳුනා ගත හැකි වැඩ ක්‍රියාකාරකමක් වන අතර රාජකාරියක් යනු කටයුතු රාශියකින් සමන්විත පුද්ගලයකු ඉටු කරන වඩා විශාල වැඩ කොටසකි.ඒ අනුව රාජකාරිය කටයුත්තකට වඩා පුළුල් දෙයකි.වගකීමක් යනු කටයුත්තක් නිසි ලෙස නැතහොත් අපේක්ෂිත පරිදි ඉටු කිරීම පිළිබඳව ඇති ඉහළ නිලධාරීන් වෙත බැඳීමයි.

## 2.රැකියා විග්‍රහය/විශ්ලේෂණය (Job Analysis)

රැකියාවක කටයුතු,රාජකාරි හා වගකීම් පිළිබඳවත්,එම රැකියාව සාර්ථක ලෙස ඉටු කිරීමට අවශ්‍ය සේවකයා සතු විය යුතු සුදුසුකම්,ගුණාංග පිළිබඳවත් කරනු ලබන ක්‍රමානුකූල විමර්ශනයකි.

රැකියා විශ්ලේෂණයෙන් ලබා ගන්නා තොරතුරු රැකියා විස්තරය හා රැකියා පිරිවිතරය සකස් කිරීමට ආධාර කර ගනියි.

**අභ්‍යාස**

1. රැකියා විස්තරයේ හා රැකියා පිරිවිතරයේ ඇතුළත් තොරතුරු ලැයිස්තුගත කරන්න.
2. රැකියාවක මූලිකාංග මොනවාද?